# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,698 - 2011 මාර්තු මස 18 වැනි සිකුරාදා - 2011.03.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 374 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 378 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 මාර්තු මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 මාර්තු මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


371- B 80207— 8,950 (2011/03)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඒකාබද්ධ රියැදුරු සේවයේ III පන්තියේ තනතුරුවලට බඳවා ගැනීම - 2010

සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ රියැදුරු සේවයේ III පන්තියේ තනතුරු පුරප්පාඩු 04ක් පිරවීම සඳහා 2010.12.24 දින *ගැසට් පත්‍රයේ* පළ කළ නිවේදනය හා බැඳේ.

02. එම අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2011 අප්‍රේල් 08 දින දක්වා දීර්ඝ කරන අතර, ඒ අනුව අදාළ අයදුම්පත් 2011 අප්‍රේල් මස 08 දින හෝ එදිනට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ, ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 07, බාන්ස් පෙදෙස, අංක 17 හි පිහිටි සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සමෘද්ධි කොමසාරිස් ජනරාල් වෙත එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ "ඒකාබද්ධ සේවයේ රියැදුරු තනතුරුවලට බඳවා ගැනීම - 2010" යනුවෙන් පැහැදිලි ව සටහන් කළ යුතු ය. මෙදිනට පසු ලැබෙන ඉල්ලුම්පත් භාර ගනු නොලැබේ.

සමෘද්ධි කොමසාරිස් ජනරාල්,
සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව.

කොළඹ 07,
බාන්ස් පෙදෙස,
සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-431

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2011 අප්‍රේල් මස 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011ක් වූ පෙබරවාරි මස 23 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3 හි
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කළුතර | හොරණ | කළුතර දිස්ත්‍රික්කයේ රයිගම කෝරළය කොට්ඨාසයේ කුළුපන ප්‍රදේශයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |

03-465

---

## දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට බඳවා ගැනීම

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරි ගණයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුර සඳහා 2011.04.15 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් මෙහි දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර 2011.04.15 දින හෝ ඊට පෙර ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ තනතුරු" යනුවෙන් සඳහන් කරන්න.

01. වැටුප් පරිමාණය :

I. උපාධිධාරීන් සඳහා රා. පරි. ච. ලේ. 6/2006 අනුව මාසික වැටුප් පරිමාණය
රු. 25,515 - 4x 645 - 8 x 650 - 16 x 1,050 - රු. 50,095 (SL2-2006)

ප්‍රාථමික ශ්‍රේණියට අදාල වැටුප් පරිමාණය
රු. 26,160 - 2 x 645 - රු. 27,450 (SL2-2006)

02. *වයස් සීමාව* :

2011.04.15 දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුය.

03. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් ;

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම ;

සහ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක ආයුර්වේද, සිද්ධ හෝ යුනානි වෛද්‍ය විද්‍යාව පිළිබඳ පස් අවුරුදු පාඨමාලාවක් හදාරා ලබාගත් උපාධියකින් පසු එක් අවුරුදු සීමාවාසික පුහුණුවක් සම්පූර්ණ කොට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වූ වෛද්‍යවරයෙකු වීම;

සහ

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත මනා මානසික හා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත පුද්ගලයෙකු විය යුතුය.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම් කරනු ලබන්නේ තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වය.

05. *උසස් කිරීම්* :

ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමෙන් පසු උසස් කිරීම් සිදු කෙරෙනුයේ ශ්‍රී ලංකා ආයුර්වේද සේවා ව්‍යවස්ථාවේ දැක්වෙන සේවා නියමයන් හා කොන්දේසිවලට අනුකූලවය.

*සටහන* :

I. 2011.04.15 දින වන විට බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් සියලුම සුදුසුකම් සපුරා ඇත්තාවූද, අවසාන උපාධි (ආයුර්වේද, සිද්ධ, යුනානි) පරීක්‍ෂණයෙන් සමත්ව ඇත්තාවූද, මේ දක්වා රාජ්‍ය සේවයේ ආයුර්වේද වෛද්‍ය පත්වීම් නොලැබී ඇත්තාවූද මුල් කණ්ඩායමේ ලියාපදිංචි වෛද්‍යවරුන් සියලු දෙනා අවසාන උපාධි පරීක්‍ෂණයේදී එක් එක් තැනැත්තා ලබා ගෙන ඇති ලකුණු පිළිවෙල මත පදනම් වූ කුසලතා අනුපිළිවෙලින් අනුමත සේවක සංඛ්‍යාවේ පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීමෙන් පසුව, අනුගාමී වර්ෂයන්හි සෙසු කණ්ඩායම්වල ආයුර්වේද/සිද්ධ/යුනානි උපාධිධාරි වෛද්‍යවරුන් ඔවුන් විභාග සමත් වූ වර්ෂ අනුපිළිවෙලින් ඉහත සඳහන් කුසලතා පදනම මතම බඳවා ගනු ලැබේ.

06. අයදුම්කරුවන් සංස්ථාපිත සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් විසින් පවත්වන සම්මුඛ පරීක්‍ෂණයකට භාජනය කොට සුදුසුකම් සනාථ කර ගැනීමෙන් පසු තෝරා ගනු ලැබේ.

07. තෝරාගනු ලබන අපේක්‍ෂකයින් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.

08. පහත සඳහන් ලියකියවිලි සියල්ලම සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලය ඉල්ලා සිටින විටෙක ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් සූදානම්ව සිටිය යුතුය. :-

1. ජාතික හැඳුනුම්පත,
2. උප්පැන්න සහතිකය,
3. උපාධි සහතිකය,
4. ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය,
5. ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය.

09. රජයේ නිලධාරින් විසින් එවනු ලබන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පමණක් ඉදිරිපත් කළ යුතුය. 2011.04.15 වැනි දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් හෝ ඒ හා සම්බන්ධ ලියකියවිලි සියල්ලක්ම ආයුර්වේද කොමසාරිස්ගේ නිල නාමයට හැර වෙනත් කිසිම නිලධාරියෙකුගේ නමට නොඑවිය යුතුය.

10. *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* 1 වැනි කොටසේ (IIඅ) ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවයේ තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල පොදු කොන්දේසි වෙතද අවධානය යොමු කරවනු ලැබේ.

11. අංක 1631 හා 2009.12.04 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට බඳවා ගැනීම සඳහා වූ ගැසට් නිවේදනය පරිදි ඉල්ලුම්පත් එවා ඇති අයදුම්කරුවන්ද මේ සඳහා නැවත අයදුම් කළ යුතුයි.

12. මෙම නිවේදනය පරිදි බඳවා ගැනීමට අදාල කටයුතු පිළිබඳ අවසාන තීරණය පත්වීම් බලධාරියා සතුවේ.

බී. ඩී. දහනායක,
ලේකම්,
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2011 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ 8,
ආයුර්වේද රෝහල් පරිශ්‍රය,
4 වන හා 5 වන මහළ,
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර ගණයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුර

01. (i) (අ) අගට යෙදෙන නම මුලකුරු සමග (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

(ආ) අගට යෙදෙන නම මුලකුරු සමග (සිංහලෙන්/දෙමළෙන්) :—————.

(ii) (අ) මුලකුරුවලින් කියවෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

(ආ) මුලකුරුවලින් කියවෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :—————.

02. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ලිපි එවනු ලබන්නේ මෙම ලිපිනයටය.)

(ii) දුරකතන අංකය :————.

03. (i) උපන්දිනය : වර්ෂය මාසය දිනය

| වර්ෂය | | | | | මාසය | | | දිනය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ii) 2011.04.15 වැනි දිනට වයස : අවුරුදු මාස දින

| අවුරුදු | | | මාස | | | දින | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

04. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐
(අදාළ කොටුවේ x ලකුණ යොදන්න)

05. විවාහකද/අවිවාහකද යන වග : විවාහක ☐ අවිවාහක ☐
(අදාළ කොටුවේ x ලකුණ යොදන්න)

06. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන වග :————.

07. ජාතිය :————.

08. ස්ථිර පදිංචි ස්ථානය අයත්,
(i) පළාත් සභාව :————.
(ii) දිස්ත්‍රික්කය :————.
(iii) ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය :————.

09. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

10. අධ්‍යාපන සුදුසුකම් :
උපාධිය පිළිබඳ විස්තර

බී. ඒ. එම්. එස්. (BAMS) ☐

බී. යූ. එම්. එස් (BUMS) ☐

බී. එස්. එම්. එස්. (BSMS) ☐

(අදාළ කොටුවේ x ලකුණ යොදන්න)

1. විශ්ව විද්‍යාලය/ආයතනය :————.
2. උපාධිය පිරි නැමූ දිනය :————.
3. පන්තිය :————.
4. ප්‍රායෝගික පුහුණුව ලැබූ වර්ෂය :————.

11. ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය පිළිබඳ විස්තර :
1. අංකය :————.
2. වර්ෂය :————.

මෙම ඉල්ලුම් පත්‍රයේ සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද මම මෙයින් සහතික කරමි. මා ආයුර්වේද වෛද්‍ය නිලධාරි තනතුරට බඳවා ගැනීමෙන් පසුව මෙහි ඇතුළත් යම් විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව පත්වීම් බලධාරියාට අනාවරණය වුවහොත් ඒ හේතුවෙන් මා තනතුරට නුසුදුසු වීමට ද, කිසියම් වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන

දිනය :————.

**ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව**

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඔහු/ඇයගේ වැඩ සහ හැසිරීම ................. බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදා හැරිය හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ පදවිය

දිනය :————.

03-472

---

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල ක්වාසි තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සුදුසුකම් ඇති පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැක. :-

අයදුම්කරු මුස්ලිම් පිරිමියකු විය යුතු අතර, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකය දරන්නෙකු හෝ නීතිඥයෙකු හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයකු විය යුතුය.
දැනට රජයේ සේවයේ නියුක්තයකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරුවන් වයස අවු. 40ට වැඩි යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුල යහපත් පිළිගැනීමක් ඇති විවාහකයකු විය යුතුය.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත්කරනු ලැබේ.

ක්වාසිවරයකු තමා පත් කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිව සිටීම නීතිමය වශයෙන් අවශ්‍යය.

ක්වාසිවරයකුට මසකට රු. 6,000 ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රු. 5,000 ක ගෙවීමක් කරනු ලැබේ.

අයදුම්පත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය මඟින් ලබාගත හැකි අතර එය සම්පූර්ණ කොට ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරේ 'කාති තනතුර සඳහා" යනුවෙන් සඳහන් කර 2011 අප්‍රේල් මස 15 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

ප්‍රියන්ත ද සිල්වා,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2011 මාර්තු 03 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

01. අකුරණ : මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

02. මහනුවර : මහනුවර දිස්ත්‍රික්කයේ කඩවත් සතර, ගඟවට හා පහත හේවාහැට ආදායම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

03. කින්නියා : ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා උප දිසාපති කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

04. කොඩියාර්පත්තු (මුතූර්) : ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කොඩියාර්පත්තු ආදායම් කොට්ඨාසයේ (මුතූර්) ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

05. මන්මුනයිපත්තු (කාත්තාන්කුඩි) : මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනයිපත්තු උතුර, දකුණ, ඉරුවිල් හා පෝරතීවු ආදායම් කොට්ඨාසයේ (කාත්තාන්කුඩි) ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

06. මාතලේ : මාතලේ අධිකරණ බල ප්‍රදේශයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

07. නින්දවූර්පත්තු : නින්දවූර් උප දිසාපති කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

08. පානදුර : පානදුර අධිකරණ බල ප්‍රදේශයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

09. යටිනුවර : මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ආදායම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

10. අක්කරයිපත්තු : අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරයිපත්තු උප දිසාපති කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

11. අවිස්සාවේල්ල : අවිස්සාවේල්ල අධිකරණ බල ප්‍රදේශයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

12. ගාල්ල : ගාල්ල අධිකරණ බල ප්‍රදේශයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

13. කළුතර : කළුතර අධිකරණ බල ප්‍රදේශයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

14. මහව : මහව අධිකරණ බල ප්‍රදේශය, මහව, වාරියපොල, නිකවැරටිය, ගල්ගමුව, අඹන්පොල, ජාගම, පාලුනාඹවල, වල්පාලුව, කනුකැටිය, අඹුක්කගම හා මෙම ප්‍රදේශයට අයත් අනෙකුත් කුඩා ගම්මාන ආදී ප්‍රදේශවල ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

15. පනාමාපත්තු (පොතුවිල්) : අම්පාර දිස්ත්‍රික්කයේ පනාමාපත්තු (පොතුවිල්) ආදායම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

16. කුලියාපිටිය : කුලියාපිටිය අධිකරණ බල ප්‍රදේශය, කුලියාපිටිය, දිවුරුම්පොල, ආරියාම, කිණියාම, හෙට්ටිපොල, පන්නල, බණ්ඩාරකොස්වත්ත, ඇලබොඩගම, බම්මාන, නාරම්මල, දඹදෙනිය, හොරම්බාව, ඇතුල්ගහකොටුව, කැකුණුගොල්ල, කොබයිගනේ, අරක්යාල සහ මෙම ප්‍රදේශයට අයත් කුඩා ගම්මාන ආදී ප්‍රදේශවල ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

17. පහතහේවාහැට : මහනුවර දිස්ත්‍රික්කයේ පහත හේවාහැට උප්පැන්න, මරණ හා විවාහ ලියාපදිංචි කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

18. මේමන් ප්‍රජාව : මේමන් ප්‍රජාව වෙනුවෙන් වූ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

19. බෝරා ප්‍රජාව : බෝරා ප්‍රජාව වෙනුවෙන් වූ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියට බඳවා ගැනීම - 2010**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය* :- 2011 මැයි මාසයේ දී සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මහනුවර දී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි* :- රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද යටත්ව පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් විය යුතු යි.

(ii) බඳවාගනු ලබන නිලධාරීන් වසර 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක පරීක්ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ. පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(iii) ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට ඇතුළු වූ නිලධාරීන් තනතුර ස්ථිර කිරීමේ දී වෙනත් කරුණු වලට අමතරව පරිවාස කාලය තුළ රාජ්‍ය භාෂාවත් එනම්, සිංහල හෝ දෙමළ භාෂාවේ ප්‍රවීණතාවය ලබාගත යුතු ය. රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ වලින් නිදහස් කරවා ගැනීම සඳහා අ.පො.ස. (සා. පෙ.) විභාගයේ සිංහල/දෙමළ විෂයයන් සමත් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද විෂය ප්‍රතිඵල සටහනේ සහතික කළ පිටපතක් හෝ විභාග සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතු ය.

(iv) පත්වීම ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, ආයතන සංග්‍රහයේ විධි විධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ නියෝගවලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය*.—MT-2-2006A- රු. 14,570 - 10 x 170 - 11 x 180 - 6 x 240 - 14 x 320 - රු. 24,170 (රා. ප. ච. 06/2006 (IV) අනුව මාසික) මෙම වැටුප් පරිමාණයේ රු. 14,570 - 10 x 170 - රු. 16,270 වැටුප් පියවරයන් මෙම තනතුරට අදාළ වේ.

II "ආ" පන්තියේ නිළධාරීන් IV වැනි වැටුප් පියවරට එළඹීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

05. *වයස් සීමාව* :-

(i) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

(ii) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(iii) මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

06. *අධ්‍යාපන සුදුසුකම්*.—ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, කෘෂිකර්මය යන විෂයයන් දෙකක් සහිතව විෂයයන් 3 කින් සමත්වීම; සහ

වැලිසර, අනුරාධපුරය, කුණ්ඩසාලේ සත්ව පාලන විද්‍යාලවලින් ලබාගත් දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය.

*සටහන*.—ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර පූර්ව සුදුසුකම් ලබාගෙන තිබිය යුතු ය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ඉල්ලුම්පත් වලංගු නොවේ.

07. *බඳවා ගැනීමේ ක්‍රමය*.—මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පොදු තරග විභාගයට පෙනී සිටිය යුතු ය.

(i) පොදු තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකට ම 50% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින් කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීම සිදුනොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේ දී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

08. විභාගය :—

(i) මෙම විභාගය සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.
(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.
(iii) ඉල්ලීම කරන ලද භාෂා මාධ්‍යය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
(iv) විභාග ගාස්තුව රු. 300 කි. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ ලබාගත් මුදල් ඇණවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතු ය.
(v) විභාග විෂයයන් : විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. :-
 (i) බුද්ධි පරීක්ෂණය,
 (ii) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය.
(vi) විෂය නිර්දේශය :

(*අ*) බුද්ධි පරීක්ෂණය : කාලය පැය 01 යි. මුළු ලකුණු 100 යි. අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත ය.

(*ආ*) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය :- කාලය පැය 01 යි. මුළු ලකුණු 100 යි. පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

(i) ශ්‍රී ලංකා කෘෂිකාර්මික හා සත්ව පාලන කටයුතු පිළිබඳ පවත්නා සම්පත්, විභවයන් වර්තමාන තත්ත්වයන් හා ආර්ථිකයට ඇති දායකත්වය,
(ii) ශ්‍රී ලංකාවේ සත්ව නිෂ්පාදන රටා, නිෂ්පාදන ප්‍රමාණයන් හා අලෙවිකරන ක්‍රම, ශ්‍රී ලංකාවේ පවතින සත්වපාලන ගොවිපළ රටා ඒවායේ පිහිටීම හා විසිරීම,

(iii) ගොවිපළ සතුන් අභිජනනය සඳහා බහුලව යොදාගන්නා ක්‍රම,
(iv) බෝවන සත්ව රෝග, සත්ව රෝග මර්ධන ක්‍රියා පිළිවෙත් රෝගී සතුන්ගේ නියැදි රැස්කිරීම හා ප්‍රවාහනය,
(v) ඒකාබද්ධ ගොවිපල් ක්‍රම හා ප්‍රතිවක්‍රීයකරන ක්‍රම,
(vi) සත්වපාලන හා ආශ්‍රිතව කර්මාන්ත, කිරි සැකසීම, මස් සැකසීම, සත්ව ආහාර නිෂ්පාදනය,
(vii) සත්ව නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ ආදායම් වියදම් ගණනය ක්‍රම, ගොවිපල් වාර්තාකරණය හා ගිණුම් විශ්ලේෂණය, සත්ව ගොවිපල් සැලසුම්කරණය,
(viii) විද්‍යාත්මක තොරතුරු ප්‍රචාරණ ක්‍රම භාවිතය හා ඒවායේ ඵලදායීතාවයන්.

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(i) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනය සමග ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. අඟල් 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරගත් ඉල්ලුම්පත්‍රය 2010.12.31 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "පශු සම්පත් සංවර්ධන නිලධාරී" තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන.—රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ii) සෑම ආකාරයකින් ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(iii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුණහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතු ය. :-

i. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————,
ii. ලිපිනය :————,
iii. ඉල්ලුම්පත් තැපැල් කළ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය :————.

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීමේ සහතික;
(iii) සත්ව පාලන ඩිප්ලෝමා සහතිකය.

*අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :-

විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක් ම විභාග ශාලාවේ දී තමාගේ අනන්‍යතාවය විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතු ය. ඒ සඳහා පහත ලේඛන පිළිගැනේ. :-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම් පත්‍රය;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*සාවද්‍ය තොරතුරු සැපයීම* :-

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ, විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේ ය. අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේ ය.

මෙම *ගැසට් පත්‍රයේ* 1 වැනි කොටස (II "අ") ඡේදයේ ආරම්භයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත් කිරීමට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතු ය.

11. මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටලුවක් මතුවුවහොත් ඒ සම්බන්ධයෙන් ද විභාගය මගින් බඳවා ගතයුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන් ද තීරණයක් ගැනීමේ බලය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතු වේ. එය අවසන් තීරණය වේ. (පශු සම්පත් සංවර්ධන නිලධාරී සේවාව පිළිබඳ සම්පූර්ණ විස්තර 2005.09.14 දිනැති අංක 1403/23 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරී සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ දක්වා ඇත.)

ආචාර්ය ඒ. ඩී. එන්. චන්ද්‍රසිරි,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්. (වැ. ආ.)

2010 ඔක්තෝබර් මස 25 වැනි දින,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

*පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය*

*සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව*

ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරී සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පශු සම්පත් සංවර්ධන නිලධාරී තනතුර සඳහා අයැදුම්පත

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

| | |
|---|---|
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |

අදාළ අංකය කොටුව තුළ ලියන්න :

සිංහල - 2
දෙමළ -3
ඉංග්‍රීසි -4

01. නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————. (*උදා.* SILVA B. A.)

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

02. ලිපිනය :————.

2.1 පෞද්ගලික :————.

2.2 රාජකාරී ලිපිනය :————.

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :————.

03. 3.1 ස්ත්‍රී /පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ සලකුණු කරන්න.)

| | |
|---|---|
| ස්ත්‍රී | |
| පුරුෂ | |

3.2 උපන් දිනය :

වර්ෂය □□□□ මාසය □□ දිනය □□

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු □□ මාස □□ දින □□

3.4 විවාහක/අවිවාහක බව (අදාළ ✓ සලකුණු කොටුව තුළ සලකුණු කරන්න.)

| | |
|---|---|
| විවාහක | |
| අවිවාහක | |

04. අධ්‍යාපන සුදුසුකම් :-

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :————. මාසය :————.

| විෂය | ලබාගත් සාමාර්ථය | විභාග අංකය |
|---|---|---|
| | | |

4.2 (අ) සත්ත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් ආයතනය :————.

4.3 සත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් වර්ෂය :————.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් : (ඇත්නම් පමණක්)

| තනතුර | ආයතනය | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :————.

මුදල් ඇනවුම් අංකය :————.

සම්පූර්ණ විභාග ගාස්තුව රු. 300 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට,
ගෙවන කාර්යාලය : පේරාදෙණිය
කුවිතාන්සිය මෙහි අලවන්න.

07. මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාළ වේ.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම දෙපාර්තමේන්තුවේ .................. ලෙස සේවය කරන ..................... මයා/මිය/මෙනවිය/ විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

03-590